පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2025.02.03 පැය 0545 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/ 197/2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්‍ා වූ වැදගත් තොරතුරු</u>

01. හදිසි අනතුරකින් පුද්ගලයෙකු මියයාම - බණ්ඩාරවෙල පොලිස් වසම.

2025.02.02 වන දින උදෑසන කාලයේ බණ්ඩාරවෙල පොලිස් වසමේ ක්‍රේග්වත්ත ඉහල කොටස ප්‍රදේශයේ අලුත්වැඩියා කරමින් තිබෙන කෝවිලක පිහිටි තොරණක් ඇඟ මතට කඩා වැටීමෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට බණ්ඩාරවෙල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්න ආරම්භ කර ඇත.

මරණකරු වයස අවුරුදු 66 ක් වූ ක්‍රේග්වත්ත ඉහල කොටස, බණ්ඩාරවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මරණකරු කෝවිලේ අලුත්වැඩියා කටයුතු සිදු කරමින් සිටින අවස්ථාවේදී මෙම අනතුරට මුහුණ පා ඇති බවට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය දියතලාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බණ්ඩාරවෙල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා ගෝනහේන කඳවුර.

2025.02.02 වන දින සවස් කාලයේ කිරිඳිවැල පොලිස් වසමේ වතුරුගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 104 මිලිග්‍රෑම් 760 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරන මුදල් රුපියල් 35000/= ක්** සමග අත්අඩංගුවට ගෙන කිරිඳිවැල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන වතුරුගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

කිරිඳිවැල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2025.02.02 වන දින දහවල් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ තමිල්නාඩු වත්ත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 38 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.

2025.02.02 වන දින රාත්‍රී කාලයේ බ්ලූමැන්ඩල් පොලිස් වසමේ බ්ලූමැන්ඩල් ප්‍රදේශයේදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 270ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන බ්ලූමැන්ඩල් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

බ්ලූමැන්ඩල් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මෝදර පොලිස් ස්ථානය.

2025.02.02 වන දින රාත්‍රී කාලයේ මෝදර පොලිස් වසමේ ෆගරීයුෂන් පාර ප්‍රදේශයේදී මෝදර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෝදර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2025.02.02 වන දින උදෑසන කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ජනතා මාවත ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන අත්තිඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

07. ගංජා හේන් වැටලීමක් - පොලිස් විශේෂ කායර් බලකා බුත්තල කඳවුර.

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදුකරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව දින 05 ක් පුරා ගෝනගංආර පොලිස් වසමේ යාල රක්ෂිත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සිදු කරන ලද වැටලීමකින් පසු **අක්කර 03 ක පමණ භූමි ප්‍රදේශයක වගා කර තිබූ ගංජා හේනක් වටලා ගංජා ගස් 188100 ක් සමග වයස අවුරුදු 37 ක් වන ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.**
තවද එම ප්‍රදේශයේම සැකකරුවන් නොමැති අක්කර 14 කට ආසන්න භූමි ප්‍රමාණයක වගා කර තිබූ ගංජා හේන් 10 ක් වටලා ගංජා ගස් ලක්ෂ නවයකට ආසන්න ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන විනාශ කර ඇති අතර නඩු භාණ්ඩ ලෙස ගංජා ගස් සාම්පල ගෝනගංආර පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

ගෝනගංආර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

මෙම වැටලීමට අදාල ඡායාරූප

08. විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමශර්න කාර්යංශය.

2025.02.02 වන දින උදෑසන කාලයේ යක්කල පොලිස් වසමේ හෙනරත්ගොඩ ප්‍රදේශයේදී ගම්පහ කොට්ඨාස අපරාධ විමශර්න අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශ රටක නිෂ්පාදිත බෝර 12 වගර්යේ ගිනි අවියක්** හා එම පතරොමක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන යක්කල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33ක් වන මුදුන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

යක්කල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

මෙම වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමග ඔබ යොමු කරමි.

09. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඉගිණියාගල පොලිස් ස්ථානය.

2025.02.02 වන දින දහවල් කාලයේ ඉගිණියාගල පොලිස් වසමේ දේවාලහිද ප්‍රදේශයේදී ඉගිණියාගල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන අම්පාර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

ඉගිණියාගල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

මෙම වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමග ඔබ යොමු කරමි.

10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගොඩකවෙල පොලිස් ස්ථානය.

2025.02.02 වන දින දහවල් කාලයේ ගොඩකවෙල පොලිස් වසමේ තිත්තවැල්පොත ප්‍රදේශයේදී ගොඩකවෙල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22ක් වන තිත්තවැල්පොත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

ගොඩකවෙල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

11. **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පනාමුර පොලිස් ස්ථානය.**

2025.02.02 වන දින දහවල් කාලයේ පනාමුර පොලිස් වසමේ ඉහලබෝටියවැව ප්‍රදේශයේදී පනාමුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53ක් වන පනාමුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

පනාමුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

12. **නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බුලත්සිංහල පොලිස් ස්ථානය.**

2025.02.02 වන දින සවස් කාලයේ බුලත්සිංහල පොලිස් වසමේ කඳන්වාඩිය ප්‍රදේශයේදී බුලත්සිංහල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 101 ක්** (බෝතල් 151) සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන කඳන්වාඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

බුලත්සිංහල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

13. **තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද සිගරට් සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශ ගුවන්තොටුපල ඒකකය.**

2025.02.03 වන අද දින අළුයම් කාලයේ කටුනායක ගුවන්තොටුපල පැමිණීමේ පයර්න්තයේදී පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් ඩුබායි සිට **තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද සිගරට් 47000 (කාටුන් 235) ක්** සමග සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 42ක් වන හෝකන්දර ප්‍රදේශයේ පදිංචිකාරියකි.

පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශ ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

මෙම වැටලීමට අදාල ඡායාරූපයක්

14. පුරාවස්තු ලබාගැනීමේ අරමුණින් කැණීම් කළ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - වැලිකන්ද පොලිස් ස්ථානය.

2025.02.02 වන දින රාත්‍රී කාලයේ වැලිකන්ද පොලිස් වසමේ නාගස්තැන්න ප්‍රදේශයේදී වැලිකන්ද පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර පුරාවස්තු ලබා ගැනීමේ අරමුණින් **කැණීම් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු කැණීම් කිරීම සඳහා යොදාගත් උපකරණ සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 47 හා 50 යන වයස්වල පසුවන වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.

වැලිකන්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

15. මාරක රිය අනතුරක් - තංගල්ල පොලිස් වසම.

2025.02.02 වන දින උදෑසන කාලයේ තංගල්ල පොලිස් වසමේ කොළඹ වැල්ලවාය මාගර්යේ පහජ්ජාව ප්‍රදේශයේදී මාතර දෙස සිට තිස්සමහාරාමය දෙසට ධාවනය වූ බස් රථයක් මගීන් බැස්සවීම සඳහා නතර කර නැවත ඉදිරියට ධාවනය කිරීමේදී එම දිශාවටම ඊට පිටුපසින් පැමිණි ත්‍රීරෝද රථයක් බස් රථයේ පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ ගමන් කල රියදුරු, පිටුපස අසුනේ ගමන් කල රියදුරුගේ බිරිඳ, දියණියන් දෙදෙනෙකු හා තවත් තරුණියක් තුවාල ලබා මාතර හා තංගල්ල රෝහල් වෙත ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මාතර රෝහලට ඇතුලත් කල රියදුරුගේ බිරිඳ මියගොස් ඇත.

මරණකාරිය වයස අවුරුදු 52ක් වූ කඹුරුගමුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තංගල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

16. මාරක රිය අනතුරක් - අලව්ව පොලිස් වසම.

2025.02.02 වන දින සවස් කාලයේ අලව්ව පොලිස් වසමේ අලව්ව නාරම්මල මාගර්යේ ගනේකන්ද හන්දිය ප්‍රදේශයේදී අලව්ව දෙස සිට නාරම්මල දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාගර්ය හරහා ගමන් කල පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා, යතුරුපැදිකරු හා පසුපැදිකරු තුවාල ලබා අලව්ව රෝහලට ඇතුලත් කර පදික පුද්ගලයා වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

මරණකරු වයස අවුරුදු 75ක් වූ අලව්ව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අලව්ව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

17. මාරක රිය අනතුරක් - හෝමාගම පොලිස් වසම.

2025.02.02 වන දින රාත්‍රී කාලයේ හෝමාගම පොලිස් වසමේ හෝමාගම කොට්ටාව හයිලෙවල් මාගර්යේ වලව්ව හන්දිය ප්‍රදේශයේදී හෝමාගම දෙස සිට කොට්ටාව දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් මාගර්ය හරහා ගමන් කල පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික පුද්ගලයා, හෝමාගම රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

මරණකරු වයස අවුරුදු 72ක් වූ හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෘත ශරීරය හෝමාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හෝමාගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

18. මාරක රිය අනතුරක් - අරණායක පොලිස් වසම.

2025.02.02 වන දින සවස් කාලයේ අරණායක පොලිස් වසමේ අඹදෙනිය වත්ත ගැවිලිපිටිය මාගර්යේ ගෙවිලිපිටිය ප්‍රදේශයේදී ගාල්ලේකඩේ හන්දිය දෙස සිට කොට්ටුන්න දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාගර්යෙන් ඉවතට පැන බෑවුමකට පෙරලීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු අරණායක රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

මරණකරු වයස අවුරුදු 69ක් වූ උස්සාපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෘත ශරීරය මාවනැල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අරණායක පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

19. මාරක රිය අනතුරක් - පමුණුගම පොලිස් වසම.

2025.02.02 වන දින රාත්‍රී කාලයේ පමුණුගම පොලිස් වසමේ මීගමුව උස්වැටකෙයියාව මාගර්යේ එපාමුල්ල ප්‍රදේශයේදී මීගමුව දෙස සිට උස්වැටකෙයියාව දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාගර්යෙන් ඉවතට පැන තාප්පයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු පමුණුගම රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත. පසුපැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා රාගම රෝහල වෙත මාරුකර යවා ඇත.

මරණකරු වයස අවුරුදු 22ක් වූ තුඩැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පමුණුගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.